ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
වාරිමාර්ග අමාත්‍යාංශය

# මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

වැඩසටහන් කළමනාකරණ ඒකකය (PMU)

**අරමුදල් සම්පාදනය : ආසියානු සංවර්ධන බැංකුව - ණය අංකය - 3625-SRI**

# ලංසු කැඳවීමයි

විවෘත තරඟකාරී ලංසුකරණය

## 2022/23 මහ කන්නය සඳහා වී වගා කිරිමට අවශ්‍ය රසායනික පොහොර (MOP) ප්‍රසම්පාදනය කිරීම.

**MI/MWSIP/ADB/GDS/MOP FERTILIZER/ICB/2022/037**

1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනෙහි (MWSIP) පිරිවැය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආසියානු සංවර්ධන බැංකුව (ADB) මගින් මූල්‍ය පහසුකම් සපයා ඇති අතර, එම මූල්‍ය පහසුකම් වලින් කොටසක් ඉහත දක්වා ඇති කොන්ත්‍රාත්තුව යටතේ වූ ගෙවීම් සඳහා යොදා ගැනීමට අදහස් කර ඇත. ලංසු තැබීම ආසියානු සංවර්ධන බැංකුවේ සුදුසුකම්ලාභී මූලාශ්‍ර රටවල්වල ලංසුකරුවන්ට විවෘත වේ.

2. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (**SCAPC**) සභාපති වෙනුවට වාරිමාර්ග අමාත්‍යාංශය නියෝජනය කරමින් මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනෙහි (MWSIP) වැඩසටහන් කළමනාකරණය ඒකකයේ (PMU) වැඩසටහන් අධ්‍යක්ෂ (“the purchaser”) විසින් **“2022/23 මහ කන්නය සඳහා වී වගා කිරිමට අවශ්‍ය රසායනික පොහොර (MOP) මෙට්‍රික් ටොන් 40,000 ප්‍රසම්පාදනය කිරීම**”සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

3. ආසියානු සංවර්ධන බැංකුවෙහි “Single stage – one envelope” ක්‍රමය යටතේ විවෘත තරඟකාරී ලංසු ක්‍රමය අනුව ලංසු කැඳවීම ක්‍රියාත්මක වේ. ලංසු තැබීම, ලංසු ලිපි ලේඛනවල විස්තර කර ඇති පරිදි සුදුසුකම්ලත් රටවල සියලුම ලංසුකරුවන් සඳහා විවෘත වේ.

4. පහත සඳහන් <u>මූලික සුදුසුකම්</u> සපුරන ලංසුකරුවන් ගෙන් පමණක් ලංසු කැඳවනු ලැබේ.

   - ආසන්නතම පසුගිය අවුරුදු තුන **(3)** තුළ ලංසුකරු විසින් රසායනික පොහොර සපයා අවසන් කළ කොන්ත්‍රාත් සඳහා සහතික කර ලබාගෙන ඇති මුළු ගෙවීම් ප්‍රමාණය **ඇ. ඩො. මිලියන 100** ක අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් තිබිය යුතුය**.**
   - ආසන්නතම පසුගිය වසර තුන **(3)** තුළදී අවම වශයෙන් කොන්ත්‍රාත්තු **2**ක් සඳහා ලංසුකරු විසින්**,** කොන්ත්‍රාත්කරු**,** බද්ධ ව්‍යාපාර හවුල්කරු (**Joint Venture partner)** හෝ උප කොන්ත්‍රාත්කරුවකු ලෙස රසායනික පොහොර සපයා තිබිය යුතු අතර අදාළ කොන්ත්‍රාත්තු අවසන් කර තිබිය යුතුය. එහි ලංසුකරුගේ සහභාගීත්වය එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා **ඇ. ඩො. මිලියන 40** ක් හෝ ඊට සමාන විය යුතුය**.**
   - ලංසුකරු විසින් ඉදිරිපත් කරන රසායනික පොහොර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර **03**ක පළපුරුද්දක් තිබිය යුතු අතර එම පිරිවිතරයන්හි සඳහන් රසායනික පොහොර හෝ එම පිරිවිතරයන්ට සමාන නිෂ්පාදන අවම වශයෙන් **මෙට්‍රික් ටොන් 40,000** ක් ආසන්නතම පසුගිය වසර තුන **(3)** තුළදී විකුණා තිබිය යුතුය.

- ලංසුකරු හෝ නිෂ්පාදකයා විසින් ඉදිරිපත් කරන රසායනික පොහොර සැපයීමට හැකි වර්ගය, ප්‍රමාණය හා සංඛ්‍යාත්මක ගණන ගැණුම්කරුගේ අවශ්‍යතාවය මත දැනුම් දෙන දිනයන්හිදී අදාළ ස්ථානයන් වෙත ප්‍රවාහනය කිරීමට කටයුතු කළ යුතුය.

- ලංසුකරුවන් සතු ද්‍රවශීල වත්කම්**,** ණය පහසුකම් මාර්ග හෝ වෙනත් මූල්‍ය සම්පත් ප්‍රමාණය **(**ගිවිසුම් ගත අත්තිකාරම් ගෙවීම් හැර**)** ලංසු ලිපි ලේඛන වල ලංසු ආකෘති **Fin-3** හි සඳහන් කර ඇති පරිදි විය යුතුය**.**

5. ලංසුකරුවන් විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් අවශ්‍යතා ලංසු ලේඛනවල ඇතුලත් කොට ඇත.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලේඛන වල මෘදු පිටපත (PDF), www.mwsip.lk ➔ Information ➔ Procurements of MWSIP යන සබැඳිය ඔස්සේ පරික්ෂා කර බැලිය හැක.

7. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, ඉංග්‍රිසි භාෂාවෙන් වූ ලංසු ලේඛන එක් කට්ටලයක් මිලදී ගැනීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්‍ෂ වෙත ebid.mwsip@gmail.com යන විද්‍යුත් ලිපිනයට scan ක්‍රමයට ඉල්ලීමක් යොමු කළ යුතුය. එවැනි ඉල්ලීමක් ආයතනයේ ලිපි ශීර්ෂයක් (Original Business Letter Head) යටතේ ලංසුකරුගේ බලයලත් නියෝජිතයකුගේ අත්සන සහිතව යොමු කිරීම අනිවාර්ය වන අතර, ලංසු ලේඛන, ලංසු තැබීමේ කාල සීමාව තුලදී නිකුත් කරනු ලබන සංශෝධන සහ පැහැදිලි කිරීම් වල මෘදු පිටපත් එවීම සඳහා ලංසුකරුගේ නම හා ලිපිනය, දුරකතන අංකය, ෆැක්ස් අංකය සහ විද්‍යුත් ලිපිනය එම ලිපියේ අන්තර්ගත විය යුතුය. එම ලිපිය ලද පසුව, ආපසු නොගෙවෙන රු.100,000.00 හෝ ඇ.ඩො. 290 ක ගාස්තුවක් ගෙවීම සඳහා සේවා ගැණුම්කරු විසින් බැංකු ගිණුම් විස්තර ලබාදෙනු ඇත. ලංසුකරු විසින් අදාළ ගෙවීම සිදු කළ සැනින් ගෙවීම තහවුරු කරන ලියවිල්ලක් ව්‍යාපෘති අධ්‍යක්‍ෂ වෙත එවිය යුතු අතර ගෙවීම තහවුරු කරගත් පසුව සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක මෘදු පිටපත බාගත කරගැනීමට හැකි වන සබැඳිය සේවා ගැණුම්කරු විසින් ලංසුකරුට එවනු ඇත.එය නිසි පරිදි බාගත කරගැනීම ලංසුකරුගේ වගකීම වන අතර ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අතරතුර හෝ ඉන් පසුව සේවා ගැණුම්කරු විසින් නොදරනු ඇත.

8. ලංසුකරුවන් සඳහා වූ පූර්ව ලංසු රැස්වීම **2022 අගෝස්තු මස 03** වන දින **පෙ.ව. 10.00** පැයට පහත සඳහන් ලිපිනයේ ඇති ව්‍යාපෘති අධ්‍යක්‍ෂ කාර්යාලයේදී පැවැත්වේ. ඒ සඳහා ලංසුකරුවන්ට සහභාගී විය හැකි අතර (උපරිමය නියෝජිතයන් දෙදෙනෙකුට, සේවා ගැණුම්කරුට පෙර දැනුම් දීමක් කර ලියාපදිංචි වීමට යටත්ව) එසේත් නොමැති නම් සපයනු ලබන සබැඳිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට ද සම්බන්ධ විය හැකි අතර ඒ සඳහා ව්‍යාපෘති අධ්‍යක්‍ෂ වෙත විද්‍යුත් ලිපියක් මගින් **2022 අගෝස්තු මස 01** වන දිනට හෝ ඊට ප්‍රථම ඉල්ලීමක් කළ යුතුය.

9. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත යොමු කරන ලද මුද්‍රා තබන ලද ලංසු, ලංසු ලිපි ලේඛන හි (Section 2 – Bid Data Sheet, ITB 21.1) සඳහන් පරිදි අදාළ වටිනාකම සහිත ලංසු ආරක්ෂකයක් හෝ ලංසු ආරක්ෂක ප්‍රකාශනයක් සමඟ **2022 අගෝස්තු මස 17** **වන දින පෙ.ව. 10.00** ට හෝ ඊට ප්‍රථම, කොළඹ 10, ටී.බී. ජායා මාවත, අංක 493 1/1, මහවැලි ජල සුරක්‍ෂිතතා ආයෝජන ව්‍යාපෘතිය, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ව්‍යාපෘති අධ්‍යක්‍ෂකගේ කාර්යාලය වෙත භාර දිම කළ යුතුය. ලංසු පත් බාරගැනීම අවසන් වූ වහාම සහභාගී වී ඇති ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියෙහි ලංසු විවෘත කරනු ලැබේ. මේ සඳහා ලංසුකරුවන්ට මාර්ගගත ක්‍රමයට වුවද සහභාගී විය හැකි අතර අදාල සබැඳිය එවීම සඳහා **2022 අගෝස්තු මස 15** වන දිනට හෝ ඊට ප්‍රථම ව්‍යාපෘති අධ්‍යක්‍ෂ වෙත විද්‍යුත් ලිපියක් මගින් ඉල්ලීමක් කළ යුතුය.

10. ලංසු සැකසීම, පූර්ව ලංසු රැස්වීමට සහභාගී වීම සහ ලංසු ගෙනැවිත් භාර දිම සඳහා ලංසුකරුවන්ට දැරීමට වන කිසිදු වියදමක් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් සේවා ගැණුම්කරු විසින් දරනු නොලැබේ.


ව්‍යාපෘති අධ්‍යක්‍ෂ,
මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන ව්‍යාපෘතිය (MWSIP),
ව්‍යාපෘති කළමනාකරණය ඒකකය (PMU),
අංක 493 1/1, ටී.බී. ජායා මාවත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.
දු. ක. : +94 11 2675810
ෆැක්ස් .: +94 11 2675227
විද්‍යුත් තැපැල් ලිපිනය: ebid.mwsip@gmail.com